# දැන්වීමයි

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයේ රාජකාරී අවශ්‍යතාවය සහ සුහසාධනය සලකා අබේරත්න මාවත කුලී නිවාස සංකීර්ණයේ නිවාස ලබා දීම**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයේ රාජකාරී අවශ්‍යතාවය සහ සුහසාධනය සලකා කුලී නිවාස ලබා දීම සඳහා අධ්‍යයන, පරිපාලන හා අනධ්‍යයන කාර්යමණ්ඩල ස්ථිර සේවක භවතුන්ගෙන් 2023.02.20 දින සිට අයදුම්පත්‍ර කැඳවනු ලැබේ. අයදුම්පත්‍රය විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් https://www.sjp.ac.lk/staff/ බාගත කළ හැකි අතර සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2023.03.13 වන දිනට පෙර සාමාන්‍ය පාලන අංශයට භාර දිය යුතුය.

කුලී නිවාස ලබා දීම සම්බන්ධයෙන් පහත සඳහන් කොන්දේසි සැලකිල්ලට ගන්නා බව කාරුණිකව දන්වා සිටිමි.

1. සේවා අවශ්‍යතාවය සහ සේවක සුහසාධනය සලකා වර්ෂ 03ක ගිවිසුමකට යටත්ව ***දෙදෙනෙකු සඳහා වෙන්කරන ලද නිවාස / පවුල් නිවාස*** සඳහා අයදුම්පත්‍ර කැඳවනු ලැබේ. (විශ්වවිද්‍යාල සේවා කාලය තුල කුලී නිවාසයක රැඳී සිටීමේ උපරිම කාලය වර්ෂ 06 ක් පමණි.)
2. කුලී නිවාසලාභියා විශ්වවිද්‍යාලය සමඟ ගිවිසුමකට බැඳිය යුතුවේ.
3. සෑම කුලී නිවාසලාභියෙකුගේ වැටුපින් මාසිකව නිවාස කුලිය, විදුලිය හා ජලය සඳහා ගාස්තු අය කරනු ලැබේ.
4. නිවැසියන් විසින් පරිභෝජනය කරනු ලබන ජල සහ විදුලි ඒකකයන්ට අමතරව සංකීර්ණයේ ඔබ වෙනුවෙන් වැයවන විදුලි හා ජල බිල්පත් හි වටිනාකම කුලී නිවැසියන් විසින් ගෙවිය යුතු වේ.
5. කුලී නිවාසලාභියෙකුගේ සේවය අත්හිටුවීමකදී සේවය අත්හිටවූ දින සිට මාසයක් ඇතුළත කුලී නිවසින් ඉවත්විය යුතුය.
6. ගිවිසුම් ප්‍රකාරව නියමිත දිනට කුලී නිවාසලාභියෙකු නිවසින් ඉවත් නොවුවහොත් විනයානුකූලව හා නීත්‍යානුකූලව පියවර ගන්නා අතර නිවාස කමිටු තීරණය පරිදි අධිභාරයක්ද අයකරගනු ලැබේ.
7. කුලී නිවාස ලබාදීම පිළිබඳ අවසාන තීරණය විශ්වවිද්‍යාලය සතුවේ.

- මේ සම්බන්ධව වැඩි විස්තර සාමාන්‍ය පාලන හා සේවා අංශයෙන් ලබා ගත හැක. ( අභ්‍යන්තර දුරකථන අංක 8248 / 8241)

ලේඛකාධිකාරී